# දෙවනගල ටැම්පිට විහාරයේ කලාත්මක අංග පිළිබඳ අධ්‍යයනයක්

ජයසිංහ එම්.පී.එන්.එන්. [1]

ටැම් හෙවත් කුළු මත ඉදිකල සුවිශේෂී විහාර ගෙවල් විශේෂයක් ලෙස ටැම්පිට විහාර හැදින්විය හැකිය. ශ්‍රී ලංකාවේ මේ වන විට 204 කට ආසන්න ටැම්පිට විහාර ප්‍රමාණයක් හඳුනාගෙන ඇති අතර ඒවා වැඩි වශයෙන් පිහිටි දිස්ත්‍රික්කයක් ලෙස සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කය හඳුනාගත හැකිවේ. මේ අතරින් අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දෙවනගල ටැම්පිට විහාරය කලාත්මක අතින් ඉතා සුවිශේෂී විහාරයකි. මෙය කලා අංගයන්ගෙන් සපිරුණු කුඩා කලාගාරයක් බඳුය. දෙවනගල ටැම්පිට විහාරයේ ඇති මෙම කලා අංග අධ්‍යනයේ අරමුණ වන්නේ එම කලාත්මක අංග හඳුනා ගෙන එහි වටිනාකම සමාජගත කිරීමයි. මේ සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස මූලාශ්‍ර අධ්‍යනය හා ක්ෂේත්‍ර ගවේශණය යොදා ගැණිනි. දෙවනගල ටැම්පිට විහාරගෙයි කලා අංග කාණ්ඩ තුනක් ඔස්සේ හඳුනාගත හැකිය. එනම් දැව කැටයම්, සිතුවම් සහ ප්‍රතිමා වශයෙනි. මෙම දැව කැටයම් දැකගත හැක්කේ ටැම්පිට විහාරගෙයි පේකඩවල, විහාරගෙයි උලුවස්සේ සහා දොර පියනෙහිය. මෙම කැටයම් සියල්ලම මහනුවර යුගයෙහි කැටයම්හි ලක්ෂණ සහිත නෙලුම් මල, පලාපෙති මෝස්තර, ලියවැල්, ඇත් රූප ආදී නිර්මාණ වලින් සමන්විත වේ. දෙවනගල ටැම්පිට විහාර තුළ සිතුවම් දැකගත හැක්කේ වියන් තලයෙහි, බාල්කවල සහ විහාරගෙයි බිත්ති මතයි. ඉතා කුඩා ඉඩකඩක මනා ලෙස කළමණාකරනය කර ගනිමින් මෙම සිතුවම් ඇඳ ඇත. මහනුවර යුගයේ සිතුවම් ආර නියෝජනය කරන මෙම සිතුවම් අතර සුවිසි විවරණ, සොලොස්මස්ථාන, උද්හිත සහ මානව රූප සිතුවම් දැකගත හැකිය. රතු සහ සුදු පසුබිමෙහි කලු, කොළ වැනි වර්ණ උපයෝගී කර ගනිමින් ඉතා සරලව මෙම සිතුවම් ඇඳ ඇත. දෙවනගල ප්‍රතිමා ගෘහය අභ්‍යන්තරයේ විසිතුරු මකර තොරණකට යටින් අලංකාර හිටි බුද්ධ ප්‍රතිමාවක් හා හිදි පිළිමයක් අසලම දක්නට ලැබේ. දෙවිවරුන්ගේ ප්‍රතිමා දෙක සහ එකිනෙකට මුහුණලා සිටින බුද්ධ ප්‍රතිමා දෙක දක්නට ලැබේ. මෙම පිළිම වහන්සේලා සඳහා කහ, රතු සහ කලු යන වර්ණය යොදා ගෙන ඇත. හිටි ඉරියව්ව සහ හිදි ඉරියව්ව මෙම ප්‍රතිමා සඳහා යොදා ගෙන ඇති අතර වීරාසන ක්‍රමය සහ අභය මුද්‍රාව යොදාගනිමින් එම ප්‍රතිමා නිර්මාණය කර ඇත. ඒ අනුව මෙම විහාර ගෙයි සිතුවම්, ලී කැටයම් සහ ප්‍රතිමා යන කලා අංගයන් මානව ක්‍රියාකාරකම් සහ ස්වාභාවික හේතූන් මත විනාශය කරා ගොස් ඇති බව වර්තමානයේදී හඳුනාගත හැකිය.

**මුඛ්‍ය පද :** ටැම්පිට විහාරය, සිතුවම්, ලී කැටයම්, ප්‍රතිමා, කලා අංග

[1]ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය, nimalshajayasinghe@gmail.com